# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1757/22 - 2012 මැයි 11 වැනි සිකුරාදා - 2012.05.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ මන්මුනෙයි නිරිත ප්‍රාදේශීය සභාවේ සභිකයකුගේ ධූරයේ පුරප්පාඩුවක් පිරවීම**

මිය යාම හේතු කොට ගෙන මන්මුනෙයි නිරිත ප්‍රාදේශීය සභාවේ සභිකයෙකුගේ ධූරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

පරමානන්දම් කපිලන් නම් වූ සභිකයා අයත්වන තමිල් මක්කල් විඩුදලෛප් පුළිකල් නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් ට දින තිහ (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයෙකු වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ ද, ඒ පක්ෂයට අයත් ඒ මන්මුනෙයි නිරිත ප්‍රාදේශීය සභාවේ සභිකයෙකු වශයෙන් තේරී පත්වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තෙකු නාම යෝජනා කිරීමට, ඉහත කී ආඥාපනතේ 65අ(2) වන වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නිශ්චිත කාල පරිච්ජේදය ඇතුළත නාම යෝජනා නොකරනු ලැබ ඇති හෙයින් ද ;

මන්මුනෙයි නිරිත ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී රත්නායක රාලලාගේ අසංක සතිස් කුමාර රත්නායක වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, 2008 මාර්තු මස 10 වැනි දින මන්මුනෙයි නිරිත ප්‍රාදේශීය සභාව සඳහා පැවැත්වූ ඡන්ද විමසීමේ දී තෝරා පත් කර ගත් අවසාන සභිකයා ළඟට වැඩිම මනාප සංඛ්‍යාව ලබා ගත් ගෝපාලපිල්ලෙයි ගුණසිංහම් මහතා ඒ පුරප්පාඩුව ඇති වූ මන්මුනෙයි නිරිත ප්‍රාදේශීය සභාවේ සභිකයෙකු වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

අසංක රත්නායක,
තේරීම්භාර නිලධාරී,
මන්මුනෙයි නිරිත ප්‍රාදේශීය සභාව.

2012 අප්‍රේල් මස 26 වැනි දින,
මැතිවරණ කාර්යාලය,
මඩකලපුව.

05 - 652